# පොත් ලිවීම තරමට ම විවේචනයත් සංකීර්ණ ය




මා ලිය කෙටිකතා, නවකතා වැඩි හරියක් පුද්ගලික අත්දැකීම් පදනම් කර ගෙන රචනා කොට ඇත. මේ කියන අත්දැකීම් කිහිපය ඒ සියල්ලටම වඩා සංකීර්ණය - අනුවේදනීය යයි ද කිව හැකි ය.

2002 සැප්තැම්බර් පළමුවැනිදා පැවැත්වුණු මගේ දෙවැනි පොත් එළිදැක්වීමේදී ජගත් ජේ එදිරිසිංහ කතා කළේ මා ලියූ කෙටිකතා පොත් දෙකක් ගැන ය. "විප්ලවය ආවොත්" සහ "නරාවළ සහ කළු හිල" යන පොත් දෙක ගැන ය. විප්ලවය ආවොත් එකතුවේ කතා බොහොමයක් අගය කළ ජගත් අනෙක් පොතේ - එනම් නරාවළ සහ කළු හිල කතා එකතුවේ එකද කතාවකට ලංසුවක් දුන්නේ නැත . එදා ඒ කතාව අගය කළ නමුත් මගේ හිත තුළ පැවති පරාජිත හැඟීම පහසුවෙන් මග හළ නොහැකි විය. මම ලේඛිකාවක ගේ පිහිට පැතුවෙමි.



ලේඛිකාව ඒ වන විටත් මට හමු නොවූ හේමමාලා හේරත් ය. ඇගේ උත්තරා නම් නවකතාව ගැන මේ රටේ ලියැවුණු පළමු විවේචනය පහන ට ලියූ මම ඒ නිසා ම ඇගේ ප්‍රත්‍යුපකාරයක් පැතූ බව මට වැටහෙන්නේ දැන් ආපසු හැරී බලන විට ය. සතියකට වතාවක් දෙකක් දුරකතනයෙන් මා අමතන්නට පුරුදුව සිටි හේමමාලා මේ කියන අවදියේ සිටියේ විදේශගතව ඇමරිකාවේ මිසූරි ප්‍රාන්තයේ බව ය, මට මතක ඇත්තේ. ඇය කතා කළේ පාන්දර හයහමාර ට පමණ ය. මගේ ඉල්ලීම මග හරින බව පෙනී ගිය පසු මගේ අමනාපය නොරිස්සුම අර දුරකතන ඇමතුමට පිළිතුරු දෙන ආකාරයෙන්ම වටහා ගත් ඇය,

"මං කතා කරනවාට අකමැති නම් මම කතා නොකර ඉන්නම්" යයි කී හැටි මට මතක් වෙයි. එහෙත් ඇය මා තරම් බොළඳ නොවූ බව ස්ඵුට කරමින් සති තුනකට පසු යළිත් කතා කළා ය. මටත් හිතකර ප්‍රතිචාරයක් දැක්වීමට සිදු විය.

*තමාගේ නිර්මාණ විවේචනය කළවුන්ට බැණ වැදුණු සුප්‍රකට සිංහල ලේඛකයන් ගැන මා අසා ඇත. කවුරුන් කළත් එයින් ප්‍රදර්ශනය වන්නේ සිය හැකියා වර්ධනය කරගන්නා ලේඛකයකුගේ ලක්ෂණ නොව පහසුවෙන් ඉහළ යාමට මාන බලන අපරිණත ලේඛකයකුගේ උද්ධච්ඡ ගුණයයි.*

හේමමාලා මගේ ඉල්ලීම මග හැරියේ කල්පනාකාරීව බව මා තේරුම් ගත්තේ අවුරුදු හතළිහක් පමණ පරණ සිද්දියක් සිහිපත් කරමිනි. ලේඛකයකු හා විද්වතකු වූ ආචාර්ය කේ ඩී පී වික්‍රමසිංහ මගේ සොහොයුරාට රැකියාවක් ලබා ගැනීමට උදවු කළේ ය. ඔහු තමාගේ "අනාගත සිහින" නම් නවකතාව මා අතට දුන්නේ ඒ උදව්වත් වක් මගින් මතක් කරමින් ය. කේ ඩී පී ට වුවමනා වූයේ මගේ විවේචනය "නවයුගය" සඟරාවේ පළ කරවීමට ය.

දින කිහිපයකට පසු දුරකතනයෙන් මා ඇමතූ ඔහු ලියා අවසන් නම් ගෙනයාමට ආ හැකි බවද පැවසී ය. මා එය ලියා තිබුණේ නැත . ලියන්නේ මොනවා දැයි සිතමිනි, මා සිටියේ. මගේ ලංසුවට අනුව නවකතාව සාර්ථක නිර්මාණයක් නොවේ. එය වර්ණනා කිරීම මට ම කරගන්නා හානියකි. ලේඛකයකු වශයෙන් මට හිමිව තිබූ පිළිගැනීම එයින් බොහෝ දුරට අඩු වීමට ඉඩ තිබිණ. ඒ නිසා මා කළේ මගේ අදහස් ලියා නැවත ඔහු කතා කරන්නට කලින් තැපෑලට දැමීම ය. එය " නවයුගයට" නොදුන් බව මට විශ්වාස ය. වෙනත් විවේචකයකුගේ ලිපියක් පළ වූවා ද යන්න මට මතක නැත .

මගේ ප්‍රතිචාරය ගැන කිසිවිටෙක අමනාපයක් නොදැක් වූ කේ ඩී පී මට වඩා පරිණත ලේඛකයකු බව මට අවබෝධ වූයේ මගේ යට කී මගේම අමනාපය සහ නොරිස්සුම ගැන කල්පනා කරන විට ය. තමාගේ නිර්මාණ විවේචනය කළවුන්ට බැණ වැදුණු සුප්‍රකට සිංහල ලේඛකයන් ගැන මා අසා ඇත. කවුරුන් කළත් එයින් ප්‍රදර්ශනය වන්නේ සිය හැකියා වර්ධනය කරගන්නා ලේඛකයකුගේ ලක්ෂණ නොව පහසුවෙන් ඉහළ යාමට මාන බලන අපරිණත ලේඛකයකුගේ උද්ධච්ඡ ගුණයයි. මමත් ඒ ගොඩටම වැටුණෙමි.

තවත් අත්දැකීමක් දෙකක් ඇත . එකක් මිතුරකුගේ කෙටිකතා පොතකට හැඳින්වීමක් ලිවීමේ කතාව ය. නොබෝදා මිය ගිය චිත්‍රශිල්පී උපසේන ගුණවර්ධන මා සමග වැඩ කළ හිතවතෙකි. දැනට වසර විස්සකට පමණ පෙර ඔහු මගෙන් ඉල්ලීමක් කළේ ය. තමා ලියන කෙටිකතා පොතකට හැඳින්වීමක් ලියා එවන ලෙසට කරන ලද ඒ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමේ දී මා නුවණක්කාර වැඩක් කළ බව වැටහුණේ පොත පළ වූ පසුව ය. "අනූ නවයෙන් බේරුණා" යන නමින් ඔහු ලියූ පොත කියවීමෙන් මට පෙනී ගියේ මාත් අනූනවයෙන් බේරුණ බව ය. මා ලියුවේ ඔහුගේ කතා ගැන නොවේ. ඔහු ගැන ය. ඔහු ගැන මා දන්නා දේ ය. ඒ නිසා ඔහුගේ අති දුබල නිමැවුමට මගේ සම්මාදමක් නොලැබුණි. එහි ඇති කෙටිකතාවක් නැත. ලිපි සියල්ලම විකාර වැල්වටාරම් ය. මා ගැන පවා පදනම් විරහිත මුසා-වාද සහිත කතාවක් ද විය. මම ඒ ගැන කිසිවක් නොකීවෙමි.

දැනට මාස කිහිපයකට ඉහත වෙනත් ප්‍රාන්තයක වාසය කරන මිතුරෙක් මා සොයා ගෙන ආවේ විශේෂ ආයාචනයක් ද කරනු පිණිස ය. තමා ලියූ නවකතාවට පෙරවදනක් ලියා දෙන්නට කරන ඉල්ලීමක්. අත්පිටපත මා අතට දුන් ඔහු මගේ පෙරවදන නොපමාව එවන්නැයි කීවේ සති දෙකකින් පමණ ශ්‍රී ලංකාවට යන නිසා ය. පොත මුද්‍රණය කරවා ගෙන එන්නට ය, ඔහු අදහස් කළේ. මම කැමැත්තෙන්ම බාර ගත්තෙමි.

බාර ගත්තාට ඉල්ලීම ඉටු කරන්නට බැරි ය. පවුලක තුන් හතර දෙනකු ගැන විස්තර ඇතත් එහි ඇති කතාවක් නැත. කොහොමටත් නවකතාවක් හැටියට එහි අගයක් මට පෙනුණේ ම නැත. මට ලිවීමට දෙයක් නැත. ලියතොත් ලිවිය හැක්කේ ලේඛකයා ගැන ය. දෙතුන් දිනක්ම මේ ගැටලුව ලිහාගන්නට දැඟලූ මම මිතුරාට ලිපියක් ලියුවෙමි. අවවාදයක් සහ කනගාටුව පළ කිරීමක්ද සහිතව ලියූ ඒ ලිපියෙන් මා කිව්වේ පොත පළ නොකළ යුතු බව ය. පොතට පෙරවදනක් ලිවීමට නොහැකි වීම ගැන කනගාටුවන බවත් සඳහන් කළෙමි. මගේ පිළිතුර තැපැල් කරන්නට කලින් ඔහු මට කතා කළේ ය. මම අර කතාවම ඔහුට විස්තර කළෙමි.

ඔහු මගේ ප්‍රතිචාරයෙන් පසුබා සිටින පාටක් නැත . මගෙන් ප්‍රශ්නයක්ද ඇසුවේ ය.

"පවුලේ තුන් දෙනාගේම කතාව එහි තියෙනවා නේද?"

මම පිළිතුරු නොදී කරබා ගතිමි. ඔහු කියන කතාවේ ඇත්තක්ද ඇත . පියා දුව සහ පුතා ගැන විස්තර එහි එන බව සැබෑය. එහෙත් පළ කළ යුතු විදියේ නවකතාවක් තබා කෙටිකතාවක්ද එහි නැති බව යමට පෙනෙන්නේ.

කතුවරයාට තමා ලියූ පොත උණහපුළුවාට උගේ දරුවා තරමට ම වැදගත් බව මට පෙනී ගියේ මේ ප්‍රතිචාරය නිසා ය. එකත් එකට ඔහු පොත මුද්‍රණය කරගෙන එන්නට ඇත. ඉන් පසු තොරතුරක් ලැබුණේ නැත. මට පිටපතක් එවන්නට ඉඩක් නැත.

ඔහුගේ නව නිර්මාණය අගය කරමින් ලියන විවේචන කියවන්නට ලැබුණොත් මම පුදුම නොවන්නෙමි.

පොත් ලිවීම තරමට ම විවේචනයත් සංකීර්ණ ය. විචිත්‍ර ය.

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS
FOR FAMILIES,
FREE CHECK UPS
FOR KIDS UNDER
7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)